දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
Inland Revenue Department

# ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් දේශීය ආදායම් පනතේ 102 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම

2024 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, එදිනට හෝ එදිනට පසු වයස අවුරුදු 18 සම්පූර්ණ වන පුද්ගලයින් වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී, බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීම අනිවාර්යය වේ.

තවද, තක්සේරු වර්ෂයක් ( එක් වර්ෂයක අප්‍රේල් මස 01 වන දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වන දින දක්වා ) සඳහා යම් තැනැත්තෙකු රු. 1,200,000/- ට වැඩි ආදායමක් ලබන්නේ නම්, ආදායම් බද්ද සඳහා ද ලියාපදිංචි විය යුතුය.

ඉහත පරිදි, ලියාපදිංචි නොවන තැනැත්තන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරවීමට කටයුතු කරනු ලබන අතර, රු. 50,000 නොඉක්මවන දණ්ඩනයකට ද යටත් විය යුතුය.

ඉහත ලියාපදිංචියට අදාළ අතිවිශේෂ ගැසට් පත්‍රය පහත දිගුවට යොමු වීමෙන් බාගතකරගත හැකිය.

http://www.ird.gov.lk/si/publications/sitepages/gazette.aspx?menuid=1602

**ලියාපදිංචිය සඳහා අයදුම් කරන ආකාරය**

1. **මාර්ගගත ලියාපදිංචිය**:

www.ird.gov.lk දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස පහත පරිදි කටයුතු කරන්න.
තවද, ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සඳහා පහත සබැඳියට යොමු වන්න.
http://www.ird.gov.lk/si/eServices/sitepages/Registration.aspx?menuid=180101

- 'ඊ-සේවාවන්' වෙත පිවිස, ඉන් පසු 'ඊ-සේවාවන් වෙත පිවිසීම' වෙත පිවිස 'බදු ගෙවන්නා ලියාපදිංචිය' තෝරන්න.
- අදාළ කාණ්ඩය තෝරා සපයා ඇති අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කරන්න.
- අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු, ඔබගේ ඉල්ලීම සමාලෝචනය කරනු ඇත.
- පසුව, බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) සඳහන් සහතිකයක් සහ එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදයක් (PIN) ලබා දී ඇති ඊමේල් ලිපිනය වෙත ලැබෙනු ඇත.
- ඒ අනුව කටයුතු කිරීමෙන්, ඔබ සඳහා වන මාර්ග ගත පහසුකම් සහිත වෙබ් ගිණුම නිර්මානය කරගත හැකිය.

2. **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැමිණ හෝ තැපැල් මගින් ලියාපදිංචි සඳහා අයදුම් කිරීම:**

- ලියාපදිංචි කිරීමේ අයදුම්පතක් සම්පූර්ණ කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, 2 වන මහලේ ප්‍රාථමික ලියාපදිංචි අංශයට හෝ ආසන්න ඕනෑම ප්‍රාදේශීය/නගර කාර්යාලයකට ඉදිරිපත් කරන්න.
- ලියාපදිංචි අයදුම්පත පහත සබැඳිය මගින් බාගත කර ගත හැකිය.
  http://www.ird.gov.lk/si/Downloads/SitePages/Forms.aspx?menuid=1603

**අවශ්‍ය ලේඛන**

ඊ-සේවාව හරහා ලියාපදිංචි වීමේදී ජාතික හැඳුනුම්පතෙහි [දෙපැත්තම පරිලෝකණය කළ(scan)] PDF පිටපතක් උඩුගත කළ යුතුය. ජාතික හැඳුනුම්පතෙහි සඳහන් ලිපිනයෙහි වෙනසක් ඇත්නම් එය සනාථ කිරීම සඳහා පිළිගතහැකි ලේඛනයක පිටපතක් ද උඩුගත කිරීමට කටයුතු කරන්න.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**